දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය
எனது இல.
My No.
PSC/EST/04-01-13/07/2016

ඔබේ අංකය
உமது இல.
Your No.
MT/03/04/05/03 (I වෙළුම)

දිනය
திகதி
Date
2021.03.05

ලේකම්

ප්‍රවාහන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2020.12.31 දිනැති ලිපිය හා බැඳේ.

02. මාගේ සමාංක හා 2017.06.22 දිනැති ලිපිය මගින් සහතික කර ඔබ වෙත යොමු කරන ලද දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂනික - නොවන බණ්ඩ 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය මෙහි ඇමුණුමෙහි (පිටු 01 කින් සමන්විත) සඳහන් සංශෝධන ඇතුළත් කර සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2021.03.04 දින අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

03. මේ පිළිබඳව අදාල නිලධාරීන් දැනුවත් කර, අදාල සංශෝධනයන් බඳවා ගැනීමේ පරිපාටියෙහි සටහන් කර තබන ලෙස වැඩිදුරටත් දන්වමි.

ආර්.ඩී.පී.එස්. ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්:

1. ලේකම් - ජාතික වැටුප් කොමිෂන් සභාව - කරු. දැ. ගැ. සඳහා
2. දුම්රිය සාමාන්‍යාධිකාරී - කරු.දැ.ගැ. සඳහා
3. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - කරු. දැ. ගැ. සඳහා

දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික - නොවන ඛණ්ඩ 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

සංශෝධන ලැයිස්තුව

<table>
<tr><th>අනු අංකය</th><th>මාතෘකාව</th><th>සංශෝධනය වියයුතු ආකාරය</th></tr>
<tr><td>1.</td><td>1.6</td><td>යොමු අංකය- PSC/EST/04-01-43/07/2016 දිනය - 2017.06.22<br>සංශෝධිත දිනය - 2019.09.03<br>සංශෝධිත දිනය - 2020.05.21<br>සංශෝධිත දිනය - 2021.03.04<br>(සංශෝධිත දිනය යොදන්න)</td></tr>
<tr><td>2.</td><td>6.1</td><td>
<table>
<tr><th>අනුමත තනතුරු නාම</th><th>තනතුර අනුමත ශ්‍රේණිය</th><th>අනුමත තනතුරු සංඛ්‍යාව</th><th>කාර්යයන්</th></tr>
<tr><td>ෂන්ටර්</td><td>III, II, I ශ්‍රේණිය</td><td>128</td><td>
• මගී, තැපැල්, ඉන්ධන හා විශේෂ දුම්රියන් සැකසීම<br>
• දුම්රිය මැදිරි, තෙල් ටැංකි, බඩු වැගන්, බලවේග කට්ටල ආදියේ නඩත්තු කටයුතු සඳහා අදාල ස්ථාන ගත කිරීම හා අදාළ ධාවනයට නුසුදුසු මැදිරි වර්ග ඉවත් කර ධාවනයට සුදුසු ඒවා ඈමිණීම<br>
• කොළඹ පිහිටි අංගනයකට, කර්මාන්ත ශාලාවකට, හැරවුම් කවයකට, ධාවනාගාරයකට අවශ්‍යතා අනුව මැදිරි, තෙල් ටැංකි, ආපදා රථ, ඩොබකර, වැගන්, බලවේග කට්ටල වෙනත් අංගනයක හෝ ධාවනාගාරයක සිට වෙනත් අංගනයකට හෝ ධාවනාගාරයකට රැගෙන ඒම.<br>
• ඉහත කටයුතු දුම්රිය ආරක්ෂක නීති රීති වලට අනුකූලව දුම්රිය පාලකගේ උපදෙස් පරිදි කටයුතු කිරීම, දුම්රිය අංගනවලට ගෙන යාමේදී ප්‍රධාන මාර්ගය හරහාද යායුතු බැවින් එහිදී අනෙකුත් මගී දුම්රිය දේපල වල ආරක්ෂාව සහ ගමන් ගන්නා මගීන්ගේ ආරක්ෂාව පිළිබඳවද සැලකිලිමත් විය යුතු මෙන්ම සම්පූර්ණ වගකීම ෂන්ටර්වරයා සතු වීම.<br>
• කොළොන්නාව වැනි අංගන වල ගිනිගන්නා සුළු ඉන්ධන වර්ග ප්‍රවාහනය කරන ගැල් ඉතා ප්‍රවේශමෙන් ආරක්ෂාකාරීව දුම්රියන් සඳහා සැකසිය යුතුය. එමෙන්ම අංගන වල රාජකාරී කරන අනෙකුත් සහායක සේවකයින් (පොයින්ට්ස්මන්, දුම්රිය කාර්ය සහායකවරුන්) ලවා අදාළ රාජකාරී කටයුතු කරවා ගැනීමේ වගකීමද ෂන්ටර්වරයා සතුය.
</td></tr>
</table>
</td></tr>
</table>